(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 153.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ජුනි 09 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1883/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනවේදී උපාධිය පිරිනමන රාජ්‍ය අධ්‍යාපන ආයතන කවරේද;

(ii) එම උපාධිය පිරිනමන රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන කවරේද;

(iii) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධිය ගුරු සේවයට බඳවාගැනීමේදී සමානව සලකන්නේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

(v) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා කාලය හා අන්තර්ගතය සමාන වන්නේද;

(vi) නොඑසේ නම්, ඒ මන්ද;

(vii) අදාළ ආයතන මඟින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවට ප්‍රායෝගික ඉගැන්වීමේ පුහුණුවක් අනිවාර්ය වන්නේද;

(viii) එසේ නම්, එම කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1885/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ කාරතීවු, සායින්දමරුදු සහ කල්මුණේ වෙරළබඩ ප්‍රදේශවල පිහිටි ප්‍රාදේශීය ජලාශ අතිරේක පෝෂක හේතුවෙන් දූෂණයට ලක්ව ඇති අතර විවිධ වර්ගයේ ජලජ වල් පැලෑටි මඟින් ආක්‍රමණයට ලක්ව වැසී ගොස් ඇති බවත්;

(ii) අධික ලෙස රොන්මඩ තැන්පත් වීමෙන් එම ජලාශවල ගැඹුර අඩුවී ඇති බවත්;

(iii) ඉහත තත්ත්ව හේතුවෙන් එම ජලාශවල ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩු වීමෙන් වර්ෂා කාලයේදී ගංවතුර ආපදා වැඩිවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශවල පරිසර හානි සහ ජලාශවල රොන්මඩ තැන්පත් වීම සම්බන්ධයෙන් නිසි ඇගයීමක් සිදු කර තිබේද;

(ii) රොන්මඩ හා ආක්‍රමණශීලී වල් පැලෑටි ඉවත් කිරීම සහ එම ජලජ පරිසර පද්ධති තිරසර ලෙස යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සැලැස්මක් තිබේද;

(iii) එසේ නම්, ඉහත ප්‍රදේශවල එවැනි ව්‍යාපෘති ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1919/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, එදිරිසිංහ පාර, ගංගොඩවිල ප්‍රදේශයේ පදිංචි අනවසර පවුල් එම ප්‍රදේශයෙන් ඉවත් කර වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම සඳහා කටයුතු යොදා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල්වලින් නිවාස හිමිවන සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල් සඳහා කොළඹගේ මාවත හෝ කාලිංග මාවත ප්‍රදේශවල නිවාස ලබා නොදී මාලිගාවත්ත ප්‍රදේශයෙන් නිවාස ලබාදීමට කටයුතු කරනු ලබන බව දන්නේද;

(v) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1924/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ විදේශගත ශ්‍රමික පවුල්වලට අයත් පාසල් යන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දරුවන් සඳහා පාසල් උපකරණ ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ක්‍රියාත්මක වන්නේද;

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන විදේශ සේවා නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) එකී නිලධාරින් විසින් වාර්තා කර ඇති ආකාරයට වයස අවුරුදු 2-5, 6-10 සහ 11-18 දරන කාණ්ඩවල පාසල් දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) 2025 වර්ෂය සඳහා ලබාදී ඇති පාසල් උපකරණ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබා දෙන දත්ත මත ඉහත තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉහත අ(iv)හි සඳහන් නිලධාරින්ට ලබා ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) පාසල් උපකරණ ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පවතින නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1926/2026

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'ඇප්තොප් වත්ත' රජයේ ඉඩමක් බව පිළිගන්නේද;

(ii) එම ඉඩම අතීතයේ සිට මේ දක්වා පවරා ඇති ආකාරය කවරේද;

(iii) එම ඉඩමේ බිම් ප්‍රමාණය කොපමණද;

(iv) මේ වනවිට මෙම ඉඩමේ පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) එම පදිංචිකරුවන් විසින් භුක්ති විඳින බිම් ප්‍රමාණය කොපමණද;

(vi) පදිංචිවී නොමැති, වගා කටයුතු පමණක් සිදු කරන සංඛ්‍යාව කොපමණද;

(vii) ඔවුන් භුක්ති විඳින බිම් ප්‍රමාණය කොපමණද;

(viii) ඉහත ඉඩමේ දළ සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ඉඩම තුළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් හඳුනාගෙන ඇති අවදානම් කලාප පිහිටා තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1931/2026

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළමනාකරණය සඳහා පෞද්ගලික සමාගම්වලට බදුදී ඇති, රජය සතු හෝ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ ඇති මුළු වැවිලි වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෞද්ගලික සමාගම්වල නම් සහ බදුදී ඇති වැවිලි වතුවල නම් කවරේද;

(iii) බදුදී ඇති එම එක් එක් වතුයායෙහි බදු කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වතුයායෙහි සේවය කරන මුළු සේවක සංඛ්‍යාව සේවක කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාර්ග, කර්මාන්තශාලා සහ ලයින් කාමර ඇතුළුව ඉහත එක් එක් වතුවලට අයත් මුළු ඉඩම් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ඇති වතුවලට අයත් මුළු වැවිලි ඉඩම් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) පසුගිය මූල්‍ය වර්ෂ පහ (05) තුළ එම එක් එක් පෞද්ගලික සමාගම විසින් ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන තිබේද;

(iv) එසේ නම්, එම මූල්‍ය ප්‍රකාශන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1938/2026

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1998 වර්ෂයේ සිට මේ දක්වා වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම කලින් කලට සිදු කර ඇති ආකාරය කවරේද;

(ii) දැනට ස්ථිර සේවයේ සහ තාවකාලික සේවයේ යෙදී සිටින වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2026 අයවැයෙන් වැඩි කළ වතු කම්කරු වැටුපට හිමිකම් ඇති වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) වැටුප් වැඩි කිරීමෙන් පසු මේ දක්වා එම පිරිසට ගෙවා ඇති මුදල කොපමණද;

(v) වැඩි කළ වතු කම්කරු වැටුප තාවකාලික සේවයේ යෙදී සිටින වතු කම්කරුවන්ට ලබාදීමට කටයුතු කර තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1992/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඒකාබද්ධ සේවා ගණයට අයත් වන සේවා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවාවල නම් කවරේද;

(iii) මේ වනවිට එම සේවාවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව සේවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක වීමට ඒකාබද්ධ සේවාවල පවතින පුරප්පාඩු පිරවීම අත්‍යාවශ්‍ය බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධව වත්මන් රජය මෙතෙක් ගෙන ඇති සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂා කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2022/2026

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිට්වා සුළි කුණාටුවෙන් ආපදාවට ලක්වූ වතු ආශ්‍රිත පවුල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වතු ආශ්‍රිතව පූර්ණ හානියට සහ අර්ධ හානියට ලක්වූ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iv) මේ වනවිට වතු ආශ්‍රිතව ඉදිකිරීමට යෝජිත නිවාස සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2039/2026

ගරු වරුණ ලියනගේ මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර ග්‍රාමීය බැංකු රන් භාණ්ඩ උකස් ගනුදෙනු සම්බන්ධයෙන්වූ බලපත්‍රය මහජන බැංකුව සතුව තිබූ බව දන්නේද;

(ii) 2026 වර්ෂයේ සිට එම බලපත්‍රය අවලංගු කර ඇති බව දන්නේද;

(iii) ඉන් පසුව එම බලපත්‍රය ප්‍රාදේශීය ලේකම් යටතට පවරා තිබේද;

(iv) ඒ හේතුවෙන් සමූපකාර සමිතිවලට විවිධ ගැටලුවලට මුහුණදීමට සිදුව ඇති බව දන්නේද;

(v) එම බලපත්‍රය නැවත වරක් මහජන බැංකුව වෙත හෝ සීමාසහිත ශ්‍රී ලංකා සමූපකාර ග්‍රාමීය බැංකු මහා සංගමයට ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 6 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 පෙබරවාරි 24 දිනැති අංක 2477/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියමය,— 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 03 දිනැති අංක 2478/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2026 මාර්තු 03 දිනැති අංක 2478/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියමය,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 03 දිනැති අංක 2478/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණය,— රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2025.03.10 සහ 2025.03.21 දිනයන්හි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිළිබඳව සිදු කරන ලද විමර්ශන සම්බන්ධයෙන් කරුණු ඇතුළත් 2025 ජූලි 25 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 243 දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4)හි විධිවිධාන ප්‍රකාරව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

*6.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2026 මැයි 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*7.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මාලදිවයින් ජනරජයේ ආණ්ඩුව අතර 2025 ජූලි මස දී අත්සන් කරන ලද ගිවිසුම සම්බන්ධයෙන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 05 දිනැති අංක 2470/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ රීති,— 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 106 සහ 78(ආ) වගන්ති සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2026 මාර්තු 12 දිනැති අංක 2479/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.05.22 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*20.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

21.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

23.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

1972/2026

ගරු රවී කරුණානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2026 වර්ෂය වනවිට අඩු ආදායම්ලාභී, මධ්‍යම ආදායම්ලාභී, ග්‍රාමීය, වතු සහ ඌන පහසුකම් සහිත නාගරික යන ජන කාණ්ඩ අනුව නිල වශයෙන් තක්සේරු කර ඇති නිවාස හිඟය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2026-2029 කාලය සඳහා නිවාස ලබාදීමේ අපේක්ෂිත ඉලක්කය සහ නිවාස වර්ගය අනුව එක් නිවාස ඒකකයක ඇස්තමේන්තුගත සාමාන්‍ය ඉදිකිරීම් පිරිවැය කවරේද;

(iii) ජාතික මධ්‍ය ගෘහස්ථ ආදායමට අඩු ප්‍රතිලාභීන්ගේ අනුපාතය කවරේද;

(iv) පවතින උකස් පොලී අනුපාත, උද්ධමනය සහ ඉදිකිරීම් පිරිවැය ඉහළ යාම අනුව නිවාස ඒකකයක දැරිය හැකි මිල තක්සේරු කර තිබේද;

(v) ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ වාස්තවික සුදුසුකම් නිර්ණායක සහ ඩිජිටල් සත්‍යාපන පද්ධති කවරේද;

(vi) 2024-2025 කාලය තුළ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ තීරණ අතරින් අක්‍රමිකතා හේතුවෙන් අභියාචනා කරන ලද හෝ සමාලෝචනය කළ හෝ අවලංගු කළ තීරණ සංඛ්‍යාව කොපමණද;

(vii) දේශපාලනීකරණය සහ ද්විගුණවීම වැළැක්වීමට විනිවිදභාවයකින් යුතු ප්‍රසිද්ධ කරන ලද ප්‍රතිලාභී ලේඛනයක් තිබේද;

(viii) මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබේද;

(ix) එසේ නම්, එම ස්ථානය සහ අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2000/2026

ගරු රවී කරුණානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හෝ ඒ ආශ්‍රිත නාගරික පුනර්ජීවන වැඩසටහන් යටතේ, දැනට පදිංචියට ගෙන තිබෙන රජය විසින් ඉදිකරන ලද මහල් නිවාස සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) එවැනි සංකීර්ණවල ස්ථාපනය කර ඇති මුළු සෝපාන සංඛ්‍යාව, දැනට අක්‍රියව පවතින සෝපාන සංඛ්‍යාව සහ 2025 වර්ෂය තුළ, සෝපානයකට අදාළව, සාමාන්‍ය අක්‍රිය කාලය කොපමණද;

(iii) 2024 සහ 2025 වර්ෂ සඳහා වෙන්කරන ලද මුළු නඩත්තු ප්‍රතිපාදන ප්‍රමාණය සහ එක් එක් වර්ෂය තුළ සැබවින්ම භාවිතා කරන ලද මුදල කොපමණද;

(iv) තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා නඩත්තු කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සහ එවැනි කොන්ත්‍රාත්තු කිසිවක් අදාළ කොන්ත්‍රාත්තු කාර්ය ඉටු නොකිරීම හේතුවෙන් අවලංගු කර තිබේද;

(v) 2023 සිට ස්වාධීන ව්‍යුහාත්මක සහ ගිනි ආරක්ෂණ විගණන සිදුකොට තිබේද;

(vi) එසේ නම්, එම තොරතුරු පාර්ලිමේන්තුවෙහි සභාගත කරන්නෙහිද;

(vii) දිගු කාලයක් සෝපාන පද්ධති අක්‍රියව පවතින විට, වැඩිහිටි සහ ආබාධිත පදිංචිකරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන හදිසි පියවර කවරේද;

(viii) කිසියම් ගොඩනැගිල්ලක් අනාරක්ෂිත ලෙසට, අර්ධ වශයෙන් අනතුරුදායක ලෙසට හෝ හදිසි ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය වන ගොඩනැගිල්ලක් ලෙසට ප්‍රකාශයට පත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2003/2026

ගරු රවී කරුණානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2025 දෙසැම්බර් 31 වන දින වන විට කොළඹ මහ නගර සභා සීමාව තුළ සහ දිවයින පුරා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර වෙන් කර දෙන ලද මුළු නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් ප්‍රතිලාභීන් අතරින් නීත්‍යානුකූලව අත්සන් කර ඇති සහ ලියාපදිංචි කළ හැකි සින්නක්කර ඔප්පු හෝ පැවරුම් සාධනපත්‍ර නිකුත් කරනු ලැබ නොමැති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී ප්‍රතිලාභීන් සංඛ්‍යාව, ව්‍යාපෘතිය අනුව සහ එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එවැනි ඔප්පු නිකුත් කරනු ලැබීමෙන් වැළැකී සිටීමට හේතුවී ඇති නිශ්චිත නෛතික, මිනුම් සිතියම්, ඉඩම් අත්පත් කර ගැනීමේ හෝ ලියකියවිලි අඩුපාඩු කවරේද;

(v) පසුගිය වසර 03 තුළ කටයුතු සිදු කෙරෙමින් පවතින ලිපිගොනු සංඛ්‍යාව කොපමණද;

(vi) වැඩකටයුතු අවසන් නොකර ගොඩගැසී ඇති ඔප්පු ප්‍රමාණය 2026 වර්ෂය තුළ අවසන් කිරීම සඳහා වන මාසික ඉලක්ක ඇතුළත් කාල නියමයන් සහිත ක්‍රියාකාරී සැලැස්ම කවරේද;

(vii) පුරවැසියන්ට ඔවුන්ගේ ඉඩම් අයිතිවාසිකම් ලබා දීම දීර්ඝ කාලීනව ප්‍රමාදවී තිබීම සම්බන්ධයෙන් කිසියම් නිලධාරියෙකුට හෝ ආයතනයකට වගකීම පවරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2057/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2025 දක්වා එක් එක් වර්ෂය තුළ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ —

(i) සිංහල, දෙමළ (මව් භාෂාව ලෙස) සහ ඉංග්‍රීසි (දෙවන භාෂාව ලෙස) විෂයයන් සඳහා පෙනී සිටි විභාග අපේක්ෂකයන් සංඛ්‍යාව;

(ii) එම විෂයයන් අසමත්වූ විභාග අපේක්ෂකයන් සංඛ්‍යාව;

(iii) ඉහත (ii)හි සඳහන් සංඛ්‍යාව, මුළු අපේක්ෂකයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස;

එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ පාසල්වල භාෂා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2058/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2025 දක්වා එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ —

(i) වාර්තාවී ඇති දරු උපත් සංඛ්‍යාව;

(ii) දරු උපත් සංඛ්‍යාවේ අඩුවීම එක් එක් වර්ෂයට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ දරු උපත් සංඛ්‍යාව අඛණ්ඩව පහළ යාමට හඳුනාගෙන ඇති හේතු කවරේද;

(ii) දරු උපත් සංඛ්‍යාව පවත්වාගෙන යායුතු ප්‍රශස්ත අගය කොපමණද;

(iii) දරු උපත් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා දරුවන් අපේක්ෂා කරන පවුල් වෙත යම් සහන හෝ වරප්‍රසාද ලබාදීමට අපේක්ෂා කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2059/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2025 දක්වා එක් එක් වර්ෂය තුළ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ —

(i) බුද්ධ ධර්මය, හින්දු ආගම, ක්‍රිස්තියානි ධර්මය සහ ඉස්ලාම් ආගම විෂයයන් සඳහා පෙනී සිටි විභාග අපේක්ෂකයන් සංඛ්‍යාව;

(ii) එම විෂයයන් අසමත්වූ විභාග අපේක්ෂකයන් සංඛ්‍යාව;

(iii) ඉහත (ii)හි සඳහන් සංඛ්‍යාව, මුළු අපේක්ෂකයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස;

එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ පාසල් තුළ ආගමික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2084/2026

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ හෝ වෙනත් අදාළ නීතියක් යටතේ හෝ අනුමත කරන ලද/ගැසට් කරන ලද සංවර්ධන සැලැස්මක් ජා-ඇල නගර සභාව, ජා-ඇල දඩුගම් පෙරුම ප්‍රාදේශීය සභාව, මිනුවන්ගොඩ නගර සභාව, කටුනායක-සීදූව නගර සභාව, මීගමුව මහ නගර සභාව, කටාන ප්‍රාදේශීය සභාව සහ ගම්පහ මහ නගර සභාව යන බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් සැලැස්මෙහි නම, නෛතික පදනම සහ අනුමත කළ/ගැසට් කළ දිනය කවරේද;

(iii) එම සැලසුම්වල පිටපත් සභාගත කරන්නේද;

(iv) එම ප්‍රදේශ සඳහා කෙටුම්පත් කළ සංවර්ධන සැලැසුම් ඉදිරිපත් කර තිබේද;

(v) එසේ නම්, ඒවායෙහි වත්මන් තත්ත්වය සහ එම සැලසුම් ඉදිරිපත් කරන ලද අධිකාරිය කවරේද;

(vi) එම පිටපත් සභාගත කරන්නේද;

(vii) එම ප්‍රදේශ සඳහා යම් කලාප සැලසුම් හෝ නියෝග (අනුමත කරන ලද, ගැසට් කරන ලද හෝ කෙටුම්පත් ස්වරූපයෙන් ඇති) අදාළ වන්නේද;

(viii) එසේ නම්, එම නෛතික අධිකාරිය සහ අනුමත කිරීමේ තත්ත්වය කවරේද;

(ix) එම පිටපත් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?